# මාධ්‍ය නිවේදනය

## 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2025

## උපකාරක පන්ති පැවැත්වීම තහනම් කිරීම

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට 5 ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2025 වර්ෂයට අදාළව 2025 අගෝස්තු මස 10 වන දින දිවයින පුරා විභාග මධ්‍යස්ථාන 2787කදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

2015.08.12 දිනැති අංක 1927/49 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත 1968 අංක 25 දරණ ප්‍රසිද්ධ විභාග පනතෙහි 22 වගන්තිය යටතේ නිකුත් කර ඇති නියෝග ප්‍රකාරව, පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට අදාළව 2025 අගෝස්තු මස 06 වන දින මධ්‍යම රාත්‍රී 12.00 සිට සම්පූර්ණ විභාගය අවසන් වන තෙක්, පහත සඳහන් කාර්යයන් සපුරා තහනම් වේ.

- විභාග අපේක්ෂකයින් සඳහා උපකාරක පන්ති සංවිධානය කිරීම සහ එම පන්ති මෙහෙයවීම.
- විෂයානුබද්ධ දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම.
- උක්ත විභාගය සඳහා අනුමාන ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම සහ ඒවා බෙදා හැරීම.
- විභාග ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න ලබා දෙන බවට හෝ ඒ හා සමාන ප්‍රශ්න ලබා දෙන බවට පෝස්ටර්, බැනර්, අත්පත්‍රිකා විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය මගින් හෝ සමාජ මාධ්‍ය මගින් ප්‍රසිද්ධ කිරීම හෝ එවැනි දෑ ළඟ තබා ගැනීම.

යම් අයෙක් හෝ ආයතනයක් හෝ වෙනත් පාර්ශවයක් මෙකී නියෝග නොසලකා ක්‍රියා කරනු ලැබුවහොත් ඒ තැනැත්තා හෝ ආයතනය හෝ එම පාර්ශවය මෙම පනත යටතේ වරදකරුවකු වේ. එසේම කිසියම් තැනැත්තෙකු හෝ ආයතනයක් හෝ පාර්ශවයක් මෙම නියෝග යම් ආකාරයකින් කඩ කිරීමක් හෝ උල්ලංඝනය කිරීමක් සිදු කළ හොත් ඒ පිළිබඳව ළඟ ම පවතින පොලිස් ස්ථානය හෝ පොලිස් මූලස්ථානය හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත පහත දුරකථන අංක ඔස්සේ පැමිණිලි කළ හැක.

| | | |
|---|---|---|
| පොලිස් මූලස්ථානය | : | 0112421111 |
| පොලිස් හදිසි ඇමතුම් අංකය | : | 119 |
| ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ක්ෂණික ඇමතුම් අංකය | : | 1911 |
| පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව | : | 0112784208/0112784537 |

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්